**විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2013**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **1996** පෙබරවාරි 09 දිනැති අංක **909/13** දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියමාවලියේ 21 වගන්තිය සහ **1978** අංක **16** දරන විශ්වවිද්‍යාල පනතේ **107(5)** උප වගන්තිය, **108** සහ **111** වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ **108(1)** උප වගන්තිය ප්‍රකාර, ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවැරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ගමන් වියදම් සඳහා රු. 28,523 ක් සහ විභාග වියදම් සඳහා රු. 17,950 ක් උපචිත වියදම් ලෙස දක්වා තිබුණු නමුත්, 2014 වර්ෂයේදී පිළිවෙලින් රු. 56,891 ක් හා රු. 241,754 ක් ගෙවා තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනවල රු. 252,172 ක ජංගම බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වාහන කුලියට දීමෙන් ලැබූ ආදායම් ලෙස රු. 490,798 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේ දී ආයතනය සතු බස් රථය සහ වෑන් රථය කුලියට දීමෙන් ලැබුණු ආදායමේ එකතුව රු. 1,031,311 ක් බැවින් රු.540,513 කින් ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව විද්‍යාගාර ඉගෙනුම් උපකරණ සහ දුරකථන හා කාර්යාල උපකරණවල වටිනාකම රු.85,619,179 ක් වුවද, 2013 දෙසැම්බර් 31 දිනට පොත් ශේෂය ලෙස රු.26,887,075 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

#### 2.2.2 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් හා අදාල උප වාර්තා අනුව ශේෂයන්හි වූ නොසැසඳු වෙනස රු.**5,046,605** ක් විය. විස්තර පහත දැක්වේ.

| ගිණුමේ නම | ගිණුම අනුව ශේෂය | උප වාර්තාවේ නම | උප වාර්තාව අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| පොළී ආදායම | 12,497,460 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 17,439,065 | 4,941,605 |
| පර්යේෂණ ප්‍රදාන | 14,888,583 | ගිණුම්කරණ සටහන | 14,993,583 | **105,000** |
| එකතුව | **27,386,043** | | **32,432,648** | **5,046,605** |

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. **8,110,415** ක් වූ පහත දැක්වෙන ගිණුම් විෂයයන් 03 සඳහා ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | බාහිර දේශන ගාස්තු | 3,613,332 | ණයහිමි සනාථ කිරීම් |
| (ආ) | ජ'නල් වවුචර් | **1,5**53,807 | ජ'නල් වවුචර් සඳහා විධිමත් අනුමැතිය නොමැතිවීම |
| (ඇ) | සේවක ණය | 2,943,276 | ණය අවකරණ ලේඛනය |
| | | **8,110,415** | |

**2:3 නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය** | |
| **(i)** 1996 පෙබරවාරි 09 දිනැති අංක 909/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ආයතන නියමාවලියේ අංක **4(K)** වගන්තිය | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ එකඟතාවයකින් තොරව අධ්‍යයන මණ්ඩල 10 ක් සඳහා විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්ය මණ්ඩලය ලෙස 324 දෙනෙකු බඳවා ගෙන තිබුණි. |
| **(ii)** 1996 පෙබරවාරි 09 දිනැති අංක 909/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ආයතන නියමාවලියේ 11(**h**) හා **I** | ආයතනයේ කටයුතු පවත්වාගෙන යෑම සඳහා අතුරු නීති නියමාවලියන් සකස් කරගත යුතු වුවත්, 2013 දෙසැම්බර් 31 දිනටද අතුරු නීති නියමාවලීන් සකස් කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| **(i) IX** පරිච්ඡේදයේ 2.2 ඡේදය | ආයතනයේ කෙටිකාලීන පාඨමාලාවල සේවය කරනු ලබන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් හට ගෙවන ලද සම්බන්ධීකරණ ගාස්තුවලින් සියයට 10 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. එසේ බැරකළ යුතු මුදල රු. **92,392** කි. |
| **(ii) XXIV** වැනි පරිච්ඡේදයේ 3.5 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් හා දෙසැම්බර් මාස සඳහා රු. 170,000 ක ණය හා පොළී නිත්‍ය වාරික මුදල් එම මාසවලදී අයකර නොතිබුණි. |

| | | |
|---|---|---|
| **(ඇ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| | මුදල් රෙගුලාසි 371 | **i.** එකතුව රු. 100,000 ක වටිනාකමින් යුතු අත්තිකාරම් මුදල් මාණ්ඩලික නොවන නිලධාරීන් 04 දෙනෙකු සඳහා ලබා දී තිබුණි.<br>**ii.** අවස්ථා 36 කදී එකතුව රු.**2,006,889** ක වටිනාකමින් යුතු අත්තිකාරම් මුදල් අදාල සීමාව ඉක්මවා ලබාදී තිබුණි.<br>**iii** අවස්ථා 12 කදී අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර රු.**189,074** ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය තුළ ලබාගෙන නැවත මුදලින් පියවා තිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක **IAI/2002/02** දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 02 ඡේදය | පරිගණක, උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක **PED/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 ඡේදය සහ 5.2.1 වගන්තිය | මානව සම්පත් සැලසුම්කරණයක් සිදු කර නොතිබුණු අතර, අයවැයගත වාර්තාව සමඟ අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කළයුතු වුවද, 2013 වර්ෂය සඳහා අයවැයගත ශේෂ පත්‍රයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඊ) | අංක 6/2010 හා 2010 ජුනි 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පෙට්‍රල් මෝටර් රථයකට කිලෝ මීටරයකට රු. 12 ක ප්‍රවාහන දීමනා ගෙවිය යුතු වුවත්, කිලෝ මීටරයකට රු. 25 ක් සහ රු. 17 ක් බැගින් ගෙවීම් කිරීම හේතුවෙන් රු. 41,882 ක මුදලක් නිලධාරීන්ට වැඩිපුර ගෙවා තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 95 සහ 2003 ජනවාරි 29 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය අංක **PE** 1/174/1-2003 දරන චක්‍රලේඛවලට අනුකූල නොවන පරිදි අවස්ථා **21** කදී රු. **924,018** ක සම්බන්ධීකරණ දීමනා සහ රු.**101,222** ක ගෞරවාන්විත දීමනා ආයතනය විසින් ගෙවා තිබුණි.

(ආ) පිළිවෙලින් 1989 ජුලි 31, 1990 මාර්තු 22, 1991 අප්‍රේල් 24, 1995 ඔක්තෝබර් 01, 1998 අප්‍රේල් 28 දිනැති 38/89, 38/89(1), 38/89(11), 38/89(111) සහ 29/98 දරන රාජ්‍ය පරිපාලන හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ විධිවිධාන අනුව දෙවන හා තෙවන භාෂා ප්‍රවීණතා දීමනා හා වැටුප් වර්ධකයන් ලබා ගැනීමට මෙම ආයතනයේ නිලධාරීන් / සේවයින්ට හිමිකම් නොමැති වුවත්, ඊට අනුකූල නොවන පරිදි කටයුතු කරමින් 1997 වර්ෂයේ සිට 2013 මැයි මස දක්වා එකතුව රු. 263,560 ක භාෂා ප්‍රවීණතා දීමනා ගෙවා තිබුණි.

(ඇ) අංක **PED/35** හා 2006 ජනවාරි 17 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 02 වන වගන්තිය අනුව විගණන හා කළමනාකරණ කමිටු දීමනා විධායක අධ්‍යක්ෂකවරුන් සඳහා පමණක්

ගෙවීම් කළ යුතු වුවත්, ඊට පටහැනිව අධ්‍යයන මණ්ඩල ලේකම්වරුන් 10 දෙනෙකු හට සමාලෝචිත වර්ෂයේදී රු. 92,400 ක් ගෙවා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අතිරික්තය රු.23,227,021 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.22,990,263 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. **236,758** ක වර්ධනයක් දක්නට ලැබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

අංක 909/13 හා 1996 පෙබරවාරි 09 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇති ආයතන නියමාවලියේ අංක 4(I) වගන්තිය ප්‍රකාරව, අධිශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, පදක්කම් හා වෙනත් තෑගී ආදිය ප්‍රදානය කිරීම හා ප්‍රදර්ශන පැවැත්වීම කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී එම කටයුතු කිසිවක් සිදු කර නොතිබුණි.

**4.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

වන කළමනාකරණ පර්යේෂණ ව්‍යාපෘතිය සඳහා 2008 ජුලි 25 දින ආයතනයට ලැබුණු රු.321,450 ක මුදල්, ව්‍යාපෘතිය භාර මහාචාර්යවරයා නමින් පෞද්ගලික ගිණුමකට බැර කර තිබුණි. ඊට අතිරේකව විවිධ අවස්ථාවලදී මෙම ව්‍යාපෘතිය සඳහා ලැබුණු රු.798,658 ක මුදල අදාළ මහාචාර්යවරයාගේ පෞද්ගලික නමින් ස්ථාවර තැන්පත් 04 ක ආයෝජනය කර තිබුණි.

**4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

බදුල්ල - මහනුවර යෝජිත අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා පාරිසරික බලපෑම සම්බන්ධව තක්සේරු කිරීමේ වාර්තාවක් සකස් කිරීම සඳහා ආයතනයේ අධ්‍යක්ෂ හා මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සමඟ අගෝස්තු මස එළැඹි ගිවිසුම අනුව අදාළ වාර්තාව 2012 නොවැම්බර් 30 දිනට පෙර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, විගණන දින වූ 2014 මාර්තු 31 දින දක්වාම එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. එහෙත් මෙම කාර්යය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා රු. **3**,175,980 ක් ගෙවීම් කර තිබුණි.

**4.4 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

ආයතනයේ ගොඩනැගිලි වත්කම්වල වටිනාකම රු. 69,452,294 ක් වුවත්, ගොඩනැගිල්ල පිහිටා ඇති භූමිය එය අයිති පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙතින් ආයතනය වෙත පවරා ගැනීමට 2013 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 38 ක් වූ අතර, අනුමත කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 15 ක් පිරවීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මේ තොරතුරු අයවැයගත දත්ත සමඟ සසඳා නොමැති බැවින් 2010 ජනවාරි 10 දින නිකුත් කරන ලද සංයුක්ත සැලැස්ම ඵලදායී සැලැස්මක් ලෙස නිරීක්ෂණය නොවූ අතර, විෂයයන් 06 කට අදාලව සංයුක්ත සැලැස්මේ සමාලෝචිත වර්ෂයට අදාළ දත්ත අනුව එකතුව රු.**115,750,000** ක් වූ අතර, අයවැයගත දත්ත අනුව ඒ විෂයයන්වල එකතුව රු.**93,100,000** ක් වූයෙන් රු. 22,650,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 5.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම් හා මුල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණද, ඊට අනුව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ **දිනැති** 02 **ජුනි** 2003**PED/12** චක්‍රලේඛයේ **කාරවඡ්‍ර** 5.2.5**,** වාර්ෂික අයවැය වාර්තාව සංයුක්ත සැලැස්මට අනුව**,** දීර්ඝ කාලීන පරමාර්ථ ඉටු කර ගැනීම පිණිස සහ වර්ෂය ආරම්භයේදී අරමුණු ඉටු කර ගැනීම පිණිස උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි**.**

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා අධ්‍යක්ෂකවරයා වෙත වරින් වර මාගේ වාර්තා මඟින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) පර්යේෂණ හා ප්‍රදානයන්
**(ආ)** ගිණුම්කරණය
**(ඇ)** ලේඛන පැවැත්වාගෙන යාම
**(ඈ)** තොග පාලනය
**(ඉ)** සේවක ණය පරිපාලනය